සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

# මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# மத்திய மாகாண கல்வித் திணைக்களம்
# Department of Education Central Province

**11 ශ්‍රේණිය** අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2019 **21 S I**

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I පත්‍රය

කාලය පැය එකයි

සැලකිය යුතුයි :- ● සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

★ **අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල ඇති එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් ඇති මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.**

01. මා සමඟ දිගු කාලයක සිට එක කාමරයේ ම වාසය කළ අමරසිංහ පසුගිය දිනෙක **පැදුරටත් නොකියා** ගියේ ය.
    1. අමනාප වී
    2. කිසිවෙකුටවත් නොකියා
    3. හිමිදිරි වෙලාවේ
    4. පැදුර ද අමතක කර

02. පිරිහෙමින් පැවති ආයතනයට **නව එළියක්** ලබා දුන්නේ තරුණ කළමනාකාරතුමා ය.
    1. අලුත් ආලෝකයක්
    2. ආලෝක ධාරාවක්
    3. නව අර්ථ කථනයක්
    4. අලුත් දියුණුවක්

03. රාත්‍රිය මුළුල්ලෙහි ඇද හැළුණ **අනෝරා වැස්ස** නිසා පිරිත් ගෙදර වැඩ කටයුතු අතරමඟ නැවතුණි.
    1. වාරකන් වැස්ස
    2. පොද වැස්ස
    3. නැවතුමක් නැති වැස්ස
    4. මඳ වැස්ස

★ **අංක 4 සිට 6 දක්වා ඇති ප්‍රශ්නවල හිස්තැන් වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

04. විවිධ සාහිත්‍ය සම්බන්ධ ලියැවුණු පොත පත, විචාර ග්‍රන්ථ ................................ කිරීමෙන් ඔබට ද සාර්ථක නිර්මාණකරුවෙකු විය හැකිය.
    1. අභ්‍යාස
    2. පරිශීලනය
    3. ප්‍රකාශනය
    4. ආභාෂය

05. නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීම සඳහා උද්යෝගයෙන් ක්‍රියා කළ සියලුම සේවකයන්ට .................................... ලැබුණේය.
    1. පාරිතෝෂිකයක්
    2. පරිශ්‍රමයක්
    3. අවධානයක්
    4. ණය මුදල

06. ගුරු සිසුන් ලෙස තේරුණු සියල්ලෝ ම ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ ............................................ යටතේ පසුවූහ.
    1. ගවේෂණය
    2. නිදර්ශනය
    3. අධීක්ෂණය
    4. පරීක්ෂණය

07. අකාරාදී පිළිවෙළ නිවැරදිව දැක්වෙන පද පේළිය තෝරන්න.
    1. අටමස්ථානය, අත්තනගල්ල, අවිස්සාවේල්ල, අනුරාධපුරය
    2. ගලපටලය, ගලගණ්ඩය, ගලගෙදර, ගලිගමුව
    3. බයිබලය, බයිසිකලය, බලංගොඩ, බණ්ඩාරවෙල
    4. පත්තරය, පරගහ, පරිප්පු, පස්යාල

08. සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
    1. ලේඛණය, පරිසංණකය, සම්ප්‍රදාය, ඖෂධ
    2. ශිෂ්‍යාචාරය, ඓක්‍යය, ලඟ, අසරන
    3. ප්‍රවෘත්ති, කාර්යාලය, විශිෂ්ට, ශ්‍රේෂ්ඨ
    4. සම්බන්ධය, වීරෝධාර, පරීක්‍ෂණ, දර්ශණ

09. එක් එක් වචනවල පිළිවෙළින් පළමු අකුරෙහි රකාරාංශයත්, දෙවන අකුරෙහි රේඵයත්, තුන්වන අකුරෙහි අනුස්වාරයත්, සිව්වන අකුරෙහි පාපිල්ලත් යෙදුණු වචන ඇතුළත් වරණය තෝරන්න.
    1. කුලියාපිටිය, මිශ්‍රණය, බංගලාව, පර්වතය
    2. ප්‍රමාණය, මාර්ගය, අලංකාරය, ගන්නෝරුව
    3. සංගමය, කාර්යාලය, මුද්‍රණය, පුදුරුව
    4. ප්‍රංශය, කර්මය, මනඃකල්පිත, අබෙිපුස්ස

10. අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
1. ගායිකාවක, අප, කිරිල්ලියන්, සොරුන්
2. මම, සෙබළෙක්, බිළිඳියක, හේ
3. කොටියා, පරීක්‍ෂකවරයෙක්, නිවේදිකාවක්, සෙබඩක්
4. ගුරුවරයෙක්, නිලධාරියෙකු, සේකරයෝ, ඇත්තු

11. මුලින් දීඇති ව්‍යාකරණ විධියට අයත් නොවන උදාහරණයක් ඇති වරණය තෝරන්න.
1. තද්ධිත - ව්‍යාපාරික, ශෛලමය, තෙරණු, සිඟිති
2. ක්‍රියා - දිවීය, බලද්දී, කියත, බලව
3. සන්ධි - කම්මල, පිළිතුරු, දකුණත, ගුරුතුමා
4. නිපාත - සමඟ, විසින්, සඳහා, විශිෂ්ට

12. "සුවිනීත" යන්න අයත් වන්නේ
1. අව්‍ය සමාසයට ය
2. අන්‍යාර්ථ සමාසයට ය
3. විභක්ති සමාසයට ය
4. විශේෂණ සමාසයට ය

13. A - සම්ප්‍රදාන විභක්තිය - <u>ඇතාගේ</u> දළ දිග ය.
B - කර්තෘ විභක්තිය - <u>ආගන්තුකයන්</u> විසින් ගෙහිමියෝ විමසනු ලබති.
C - කර්ම විභක්තිය - ගොවියෝ <u>වැව් ජලයෙන්</u> කුඹුරු වගා කරති.
D - ආලපන විභක්තිය - <u>මිනිසුනි</u>, යහ වැඩෙහි යෙදෙන්න.

ඉහත විභක්ති උදාහරණ සමඟ ගැලපූ විට නිවැරදි වරණය වන්නේ,
1. A හා D ය. 1. B හා D ය. 1. B හා C ය. 1. A හා C ය.

14. "ඈ ඉඟටිය සොළවා දුටුවන් මවිතයට පත් කරමින් මනහර නැටුමක් ඉදිරිපත් කළාය" යන වාක්‍යයේ ඇතුළත් තද්ධිත පදයක් වන්නේ,
1. දුටුවන්
2. මනහර
3. ඉඟටිය
4. නැටුමක්

15. "බළලුන්ගේ" යන පදයේ ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කළ විට නිවැරදිව දැක්වෙන්නේ,
1. බළ + ලුන්ගේ
2. බළ + උන්ගේ
3. බළලා + උන්ගේ
4. බළල් + උන්ගේ

16. පරස්වර ලෝප සන්ධියට උදාහරණයක් වන්නේ කුමක් ද?
1. අතිනත
2. මැදගිල්ල
3. මිණිබරණ
4. ලම්බෝදර

17. දෙමාපියෝ **දරුවනට** අවවාද දෙති.
මෙහි තද කළු අකුරින් මුද්‍රිත පදය අයත් වන්නේ
1. ප්‍රථමා විභක්තියට ය
2. කර්තෘ විභක්තියට ය.
3. අවධි විභක්තියට ය.
4. සම්ප්‍රදාන විභක්තියට ය.

18. තද්ධිත හා කෘදන්ත හඳුන්වන පොදු නම වන්නේ,
1. අව්‍ය පද
2. ප්‍රත්‍යාර්ථ නාම
3. සමාස නාම
4. සර්ව නාම

19. අංකිත පද අයත් වන ක්‍රියා වර්ග පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
බැතිමත්හු දෙවියන් **යදිමින්** පුද පූජා **පවත්වා** ස්වකීය අපල හා ග්‍රහදෝෂ **දුරුවේවායි** ප්‍රාර්ථනා **කළහ**.
1. මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා, ආශිර්වාද ක්‍රියා
2. ආශිර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා
3. මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, අවසාන ක්‍රියා
4. පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, අවසාන ක්‍රියා

★ **අංක 20 සිට 22 තෙක් ඇති වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත කොටස් කවර ව්‍යාකරණ වර්ගයකට අයත් දැයි තෝරන්න.**

20. ආහාර පිසීම සඳහා **පොල්තෙල්** යොදා ගැනේ.
1. විශේෂණ සමාසයට ය.
2. විභක්ති සමාසයට ය.
3. අන්‍යාර්ථ සමාසයට ය.
4. අව්‍යය සමාසයට ය.

21. "**බුරන** බල්ලෝ සපා නොකත්" යනුවෙන් ව්‍යවහාරයක් අප අතර පවතී.
1. කෘදන්ත
2. සමාස
3. නිපාත
4. සන්ධි

22. කළටි පොල් කැමට ඇතැම්හු ප්‍රිය කරති.
   1. සමාස   2. කෘදන්ත   3. නාමපද   4. තද්ධිත

23. ගෞරවාර්ථ බහුවචන නාමපදයක් උක්තය වශයෙන් යෙදී ඇති වරණය තෝරන්න.
   1. අයෙක් සොරකම් කොට සිරගෙවල ලගිති.   2. මුවරළ බිය වී දුවන්නට වූහ.
   3. මගේ දියණියෝ දක්ෂ ගායිකාවක් වෙති.   4. දෙවියෝ අහසේ සැරිසරති.

24. මුලින් දී ඇති පදය නිවැරදි ලෙස විසන්ධි කර ඇති වරණය තෝරන්න.
   1. දුප්පත් = දුප් + පත්   2. සුළඟිල්ල = සුළ + ඟිල්ල
   3. මල්ලත්ත = මල් + අත්ත   4. දකුණත = දකුණ් + අත

25. උපසර්ගයක් සහිත පදයක් ඇතුළත් වරණය තෝරන්න.
   1. රෝහලේ සියලු වාට්ටු රෝගීන්ගෙන් පිරී පවතී.
   2. ජීවත්වීමේ උපාය මාර්ග සොයා ගැමියෝ නගරවලට ඇදී එති.
   3. අන්‍යයන්ට අපහාස කිරීම වරදකි.
   4. දෛවඥ මහතා මගේ කේන්දරය බලා පලාපල කීවේ ය.

★ අංක 26 සිට 28 දක්වා ඇති ප්‍රශ්නවල එක් එක් ප්‍රකාශයෙහි අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

26. තමාට අපහසු කාර්යයක් වෙනත් ක්‍රමයකින් කර ගැනීම
   1. වෙියන්ගේ තුඹසින් නාගයන් ප්‍රයෝජන ගැනීම.   2. බළලුන් ලවා කොස් ඇට බෑවීම.
   3. අටුව කඩා පුටුව සෑදීම.   4. බූරුවා බල්ලාගේ වැඩේ කිරීම.

27. තමන් සතු දේ අනුන්ට දී වෙන කෙනෙකුගෙන් එය ලැබීමට තැත් කිරීම.
   1. අඬුව තිබෙද්දී අත පුලුස්සා ගැනීම.   2. අත දීලා දත නියවීම
   3. අත්තටු කපා පියාඹන්නට කීම.   4. ඇමක් දී මාළුවකු අල්ලා ගැනීම.

28. බිය සැක නැතිව හිතුමනාපේ යමක් කිරීම.
   1. පාළු ගෙයි වළං බිඳීම   2. අනේ කාලේ වනේ වාසේ
   3. ආඩි හත් දෙනාගේ කැඳ ඉවීම   4. අටුවෙන් දුමට පැනීම

★ අංක 29 සිට 33 දක්වා එක් එක් ප්‍රශ්නයෙහි දී ඇති වාක්‍ය අතුරෙන් ව්‍යාකරණානුකූල ව ගැළපෙන නිවැරදි වරණය තෝරන්න.

29. 1. පයින් යන්නෝ පාරේ දකුණු පසින් යා යුතුය.   2. පයින් යන්නන් පාරේ දකුණු පසින් යැම මැනවි.
   3. පයින් යන්නන් පාරේ දකුණු පසින් යා යුත්තා හ.   4. පයින් යන්නන් පාරේ දකුණු පසින් යා යුත්තේය.

30. 1. සොරු දෙදෙනෙක් අත් අඩංගුවට පත්විය.
   2. සැකකරුවෝ සියලු දෙනා නිදහස් කරනු ලැබුවේය.
   3. කම්කරුවෝ පස් දෙනෙක් සතියකින් පාලම තනා නිම කළේය.
   4. සිසුහු තිදෙනෙක් විශිෂ්ට සම්මාන හිමි කර ගත්හ.

31. 1. ළමයින් සියල්ලෝම පැමිණ සිටියහ.   2. ළමයි සියල්ලන්ම පැමිණ සිටියහ.
   3. ළමයි සියල්ලෝම පැමිණ සිටියහ.   4. ළමයින් සියල්ලන්ම පැමිණ සිටියහ.

32. 1. දේශපාලඥයෝ සත්‍ය වසන් කරන්නේ ඇයි?   2. අපි සාකච්ඡාවට කැඳවන්නේ කව දා ද?
   3. දක්ෂ ගායිකාවක් වන්නේ කෙසේ ද?   4. දේශපාලඥයන් සත්‍ය වසන් කරන්නේ ඇයි?

33. 1. පාසලේ මුල් ගුරුතුමා ශිෂ්‍යයන්ට තෑගි බෙදා දුන්හ
   2. මම රූපවාහිනිය නරඹද්දී දෙමව්පියෝ පැමිණිය හ.
   3. ශිෂ්‍යයෝ කැටුව ගුරුවරු පන්ති කාමර වලට ගියහ.
   4. දරුවන් අද හවසට ගෙදර යන්නේ නැත.

34. හෙයියම්මාරුව, හෙවනැල්ල, සුන්නද්දූලි, ගම්පෙරළිය
A - අජිත් තිලකසේන B- ඒ.වී. සුරවීර C - මාර්ටින් වික්‍රමසිංහ D-සිරි ගුණසිංහ

ඉහත කෘතීන් කතුවරුන් හා ගැළපූ විට නිවැරදි අනුපිළිවෙල වන්නේ,
1.A,B,D,C 2. D,A,B,C 3. C,B,A,D 4. B,D,A,C

35. හැම්ලට්, ඔතෙලෝ, මැක්බත්, කිංග් ලියර් යන කෘතීන් ලියන ලද්දේ,
1. විලියම් ශේක්ස්පියර් විසිනි. 2. ලියෝ ටෝල්ස්ටෝයි විසිනි.
3. කැතී ග්ලාස් විසිනි. 4. විලියම් හූෆර් විසිනි.

36. " මම මේ වැඩේට සතයක්වත් සම්මාදන් කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ"
"පෙරදිගට ගියත් අපරදිගට ගියත් මට පිළිතුරු දෙන්නට බැරි දෙයක් කවුරුවත් නොඅසති"
"උඹට තවම මේවා තේරුම් ගන්ට වයස මදි පැටියෝ"
"දරුවෙකුගේ කළගුණ නොදත්කම සර්පයකුගේ විස දළටත් වැඩියෙන් තියුණු යැ යි"

A - තලමල පිපිලා B - බලන්ගොඩින් ගැලූ පැණසර මෙත් ගඟුල
C - ශෝකයත් රසයක් කළ මිනිසෙක් D- වතුර මල

ඉහත උධෘත, පාඩම් හා ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ වන්නේ,
1.C,B,A,D 2. D,B, A,C 3. D,C,A,B 4. B,D,C,A

37. කමත් භාෂාවේ දී "කුටාලම" යනුවෙන් ව්‍යවහාර කරනු ලබන්නේ,
1. කමතට අළු ඉසින උපකරණයකි. 2. වී මැනීමට භාවිත කළ උපකරණයකි.
3. කාටුව බෙරීමට භාවිතා කරන උපකරණයකි 4. කුඹුරට යන විට අරන් යන මල්ලකි.

38. පහත සඳහන් කවියේ හතර වන පදය තෝරන්න.
එබසට ලජ්ජාවෙන් ලද බැමිණී
අබ සැට ලාසක් පුපුරන ලෙසිනී
විළි වැද ඉවසා රොස් කොට එඩිනී
..........................................................................................

1. තරහෙන් ගෙට ගොස් ඇඳ මත වැටුණී 2. ගැහැණුන් හා රණ්ඩුවකට වැදුණී
3. කළගෙඩි බිඳ ගොස් තම ගෙට වැදුණී 4. බමුණා හා රණ්ඩුවකට වැටුණී

39. " දෙයක් වේ නම යම් - සුදුස්සාට ම අයිති විය යුතුය" යන කොටස අයත් වන්නේ,
1. තලමල පිපිලා නාට්‍යයට ය. 2. එලොව ගිහින් මෙලොව ආවා නාට්‍ය ට ය.
3. මනමේ නාට්‍යයට ය. 4. හුණුවටයේ කතාව නාට්‍යයට ය.

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.
ළමා පරපුර සාහිත්‍ය රස වින්දනයට යොමු කිරීම සඳහා රූපවාහිනී වැඩසටහන් සාර්ථක ලෙස යොදා ගත හැකිය.
1. රූපවාහිනී වැඩසටහන් මඟින් සාහිත්‍ය රස විඳීමට ළමයින් උනන්දු කරවීමට පුළුවන.
2. ළමයින් සාහිත්‍ය රසවින්දනය පිළිබඳ මුල් අත්දැකීම් ලබා ගන්නේ රූපවාහිනිය නැරඹීමෙනි.
3. රූපවාහිනියේ බලපෑම මත සාහිත්‍ය රස වින්දනය ළමයින්ගේ විනෝදාංශයක් බවට පත් වී ඇත.
4. සාහිත්‍යය රසාස්වාදය හා ළමා පරපුර අතර පැවැතිය යුත්තේ අඛණ්ඩ සම්බන්ධයකි.

* * * * * *

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

11 ශ්‍රේණිය අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2019 | 21 | S | II

# සිංහල භාෂාව හා සාහිත්‍යය - II පත්‍රය

කාලය පැය දෙකයි

සැලකිය යුතුයි :- ● ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
● මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

● **අංක i සිට x දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනු කොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(01) i. වර්ගාක්ෂර වලින් පමණක් උදාහරණ සපයමින් පිළිතුරු සපයන්න.
(අ) දිවේ මැද තොටස තල්ල වෙත සමීප වීම නිසා උපදින ශබ්ද කුමන නමකින් හැඳින්වේ ද ? උදාහරණ 2 ක් දක්වන්න.
(ආ) දිවේ අග කොටස උඩු දත් වැටියේ ස්පර්ශ වීමෙන් උපදින ශබ්ද කුමන නමකින් හැඳින්වේ ද? උදාහරණ 2 ක් දක්වන්න.

ii. තද කළු අකුරින් මුද්‍රිත පද වල ව්‍යාකරණ වර්ගය ලියන්න.
(අ) **නටන්නා** පෙරහරේ ගමන් කරයි. (ආ) **සියපත** සවසට මුකුලිත වේ.

iii. පහත සඳහන් විසන්ධි පද සන්ධි කොට ලියා සන්ධි වර්ගය ද නම් කරන්න.
(අ) ලිඳ + පඩිය (ආ) දුක් + පත්

iv. පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස්ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
සුපේෂල භික්ෂුවක වශයෙන් ධර්ම ඥානයෙන් ප්‍රබාවත් වූ බුද්ධියෙන් අවබෝධ කරගත් සංකල්ප පරහිතකාමීව අන්‍යයන්ට බෙදා දීමට පුවත්පත් සඟරා ආදිය යොදා ගැනීම වැඩදායක විය.

v. පහත සඳහන් වචන වල තේරුම ලියන්න.
(අ) අංගනය (ආ) සබවස

vi. පහත සඳහන් (අ) සහ (ආ) යටතේ දැක්වෙන අදහස් වලට ගැළපෙන තනි පදය බැගින් ලියා දක්වන්න.
(අ) සාමාන්‍ය බුද්ධිය හීන වූ තැනැත්තා (ආ) හිරු අවරට යෑමෙන් පසු ආහාර අනුභවය

vii. පහත දැක්වෙන වාක්‍ය සදොස් නම් නිදොස් කර නැවත ලියන්න.
(අ) සෙබළුන් විසින් ත්‍රස්තවාදීන් වනසන ලදහ. (ආ) අප විසින් පහන් දල්වෙති.

viii. පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.
(අ) ආයතන ප්‍රධානියා ඔවුන් කැඳවීය. (ආ) ඔහු මා රැක්කේ ය.

ix. පහත සඳහන් (අ) සහ(ආ)යෙදුම් වල පළමු වැනි වචනය සමඟ දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමු වචනය හෝ දෙවැනි වචනය හෝ සකස් කර ලියන්න.
(අ) අවමඟුල් උත්සවය (ආ) වෙස්සන්තර සිරිත

x. පහත සඳහන් ප්‍රාදේශීය ව්‍යවහාර පදවල පොදු ව්‍යවහාර අර්ථ ලියා දක්වන්න.
(අ) කුඩහලුවා (ආ) පනිත්තලයා (ල. 2 x 10 = 20)

(02) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් <u>එකක්</u> තෝරා ගෙන <u>වචන 250 කට නොඅඩු වන සේ</u> රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) විද්‍යුත් මාධ්‍ය කෙතරම් ව්‍යාප්ත වුව ද පුවත්පත තවමත් ජනතාවට තොරතුරු සපයන ප්‍රමුඛ පෙළේ මුද්‍රිත මාධ්‍යයක් බව කිව හැකිය. මෙකී මාධ්‍යයෙන් සිදුවිය යුත්තේ නිවැරදි තොරතුරු නිසි වේලාවට ජනතාව අතරට පත් කිරීම ය. සමාජ, ආර්ථික, සංස්කෘතික තොරතුරු ඉදිරිපත් කරමින් ජනතාව දැනුමෙන් පෝෂණය කරවීමේ මහඟු සේවාව පුවත්පත් මඟින් ඉටු කරමින් විශාල ජාතික මෙහෙවරක් සිදුකරයි. ඒ අනුව ජනමාධ්‍යකරුවා සතු වගකීම් රැසකි. ඔහු නිවැරදි වූත්, අපක්ෂපාතී වූත් තොරතුරු ගෙනහැර පාමින් සමාජ සුචරිතය සැලසීමේ වගකීම නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට වග බලා ගත යුතුය. එසේම ජනමාධ්‍ය නිදහසට රජය ද අවසර දිය යුතුය.

(ආ) ක්‍රීඩාව නිරෝගීකම රැක ගැනීමට පමණක් නොව ජය පරාජය විඳ දරා ගැනීමටත් ජනතාවගේ ශාරීරික හා මානසික සෞඛ්‍යය සඳහාත් වන පරිදි සමබර පෞරුෂත්වයකට මඟ පාදයි. අද වන විට විවිධ ක්‍රීඩා සංගම් විවිධ ව්‍යාපාරිකයන්ගේ සහ දේශපාලන බලවතුන්ගේ බවට පත්වෙමින් පවතී. මේ හේතු නිසා දක්ෂ ක්‍රීඩකයන් වෙනුවට අමුතුම වර්ගයේ ක්‍රීඩකයින් පිරිසක් ක්‍රීඩාව සඳහා අවතීර්ණ වී ඇත. ගම්බද ප්‍රදේශවල ක්‍රීඩා කුසලතා ඇති දරුවන්ට ක්‍රීඩාවෙන් ඉලක්ක ජය ගන්නට පාසල් ක්‍රීඩා මහත් පිටුවහලක් වෙයි.

(ඉ) ජනමාධ්‍යයන්හි රිය අනතුරක් ගැන සඳහන් නොවන දිනයක් සොයා ගැනීමට නොහැකි තරමටම වර්තමානයේ රිය අනතුරු බහුල වී ඇත. එම හේතුවෙන් විශේෂයෙන්ම රටට විශාල ජීවිත සංඛ්‍යාවක් අහිමි වන අතර අංග විකලත්වයට පත්වන පිරිස ද අති විශාල ය. දිනපතා සිදුවන රිය අනතුරුවලට හේතු හා ඒවා අවම කර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කිරීම ප්‍රමුඛතම කාර්යයක් සේ සලකා ක්‍රියා කළ යුතුය.

(ඊ) විවිධ පිළිකා ජනනය කිරීමේ මූල කාරකයක් වීම, ගිනි තැබීමෙන් වායු දූෂණය ඉහළ යාම, දිරා නොයන නිසා පාංශු දූෂණය වීම වැනි පාරිසරික හා සමාජ ගැටලු රාශියක් නිර්මාණය වීමට මූලාශ්‍ර වී ඇත්තේ පොලිතින් භාවිතයයි. විවිධ උත්සව අවස්ථා, ආහාර ද්‍රව්‍ය රැගෙන යාම ඇතුළු නූතන සමාජ ක්‍රියාකාරකම් වලට පොලිතින් නැතිවම බැරි අංගයක් බවට පත් ව ඇත. රජය මඟින් මේ සඳහා පොලිතින් නිෂ්පාදනය හා භාවිතය තහනම් කිරීමට විවිධ අවස්ථා වල විවිධ අණපනත් මඟින් නීති රීති ක්‍රියාත්මක කළ ද, ඒවා ක්‍රියාත්මක වීම සාර්ථකව සිදුවනවාද යන්න ප්‍රශ්නයකි. පොදු ජනතාව ලෙස පරිසරයේ සුන්දරත්වය ආරක්ෂා කිරීමට අප සියලු දෙනාටද කිසියම් ආකාරයකින් දායක විය හැකිය.

(ලකුණු 25)

(03) පහත සඳහන් ඡේදය වචන 50-60 වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

සාගර පතුල අලංකාරවත් කරන පෙඳ හා පැළෑටි වර්ග මෙතෙකැයි ප්‍රමාණ කළ නොහැකිය. අපා, දෙපා, සිවුපා, බහුපා ආදී ගොඩබිම වෙසෙන බොහෝ සත්ව වර්ගවල හැඩරුව ගත් මත්ස්‍යයෝ සයුරු කුස තුළ වෙසෙති. මුහුදු ඉත්තෑවා, මුහුදු සිංහයා, මුහුදු ඌරා, මුහුදු අශ්වයා යනාදී වශයෙන් මේ ජලජ සත්වයන් නම් කරනු ලැබුවේ එකී සමානකම් බලා විය හැකි ය.

මිහිමත ඇති ඛනිජ සම්පත්වලට වඩා සිය දහස් ගුණයකින් වැඩි සම්පත් ප්‍රමාණයක් සාගරය තුළ ආරක්ෂා වී ඇත. එබැවින් අප අවට ඇති මහ සයුර මහත් ධන නිධානයකි. ඛනිජ ද්‍රව්‍ය රාශියක් හා මිශ්‍ර වී ඇති සාගර ජලය අනාගතයේ දී මිනිසාට විශාල මෙහෙයක් ඉටු කරනු ඇත. එහි වටිනා ඛනිජ වර්ග රාශියක් සංයෝග වී ඇත. මුහුදු ජලයෙන් මැග්නීසියම් හා බ්‍රෝමීන් ලබා ගැනීම අද බහුල ව කෙරෙන්නකි. මිල්ක් ඔෆ් මැග්නීසියා නම් සුලබ බෙහෙත් වර්ගයේ සිට චන්ද්‍රිකාව දක්වා වන විවිධ දේ තැනීමටත් ප්‍රයෝජනවත් වන මැග්නීසියම් ලෝහය අද වැඩිපුර ම ලැබෙන්නේ සාගර ජලයෙනි. ඩයි වර්ග හා ඖෂධ තැනීමටත් ඡායාරූප කර්මාන්තය සඳහාත් බෙහෙවින් යොදා ගනු ලබන මූල ද්‍රව්‍යයකි, බ්‍රෝමීන්. අද ලෝකයට අවශ්‍ය බ්‍රෝමීන්වලින් සියයට හැත්තෑවක් සාගර ජලයෙන් ලැබේ. (ලකුණු 10)

(04) පහත දැක්වෙන ගද්‍ය කොටස කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

පැරණි සිංහලයාගේ තාක්ෂණික ඥානය ප්‍රගුණ කරන මුඛ්‍ය සාධකයක් වශයෙන් වැව් හා ඇළවල් දැකිය හැකිය. ගංගා නිම්න හරහා වේල්ලක් බැඳ වැසි කාලයේදී ලැබෙන ජලය කෘතීම ජලාශයක රඳවා ගැනීම ආසියානු රටවල පුරාණයේ සිට ම පැවති සරල ක්‍රියාවකි. එහෙත් පැරණි සිංහලයන් ගේ ජල සම්පාදන ක්‍රම ජල විද්‍යාවේ මූලධර්ම මත ගොඩ නැගුණ විශේෂඥ දැනුමක් අවශ්‍ය සංකීර්ණ ක්‍රියාදාමයක් විය. ඇළහැර වේල්ල හා මිණිපේ වේල්ලත්, කලා වැවේ ජලය අනුරාධපුරයේ සිට තිසා වැවට ගෙන යනු සඳහා ඉදිකර ඇති ජය ගඟ නම් ඇළ අපේ ඉංජිනේරුවන්ගේ විශේෂඥතාවය විදහා දක්වයි.

ඉඩම් මැනීම, ලකුණු කිරීම, මට්ටම් කිරීම ආදී කරුණු ගැන පුරාණ සිංහලයන් තුළ තිබුණු තාක්ෂණික ප්‍රවීණතාව ඉතා පෘථුල එකකි. එක්තරා ලන්දේසි ඉංජිනේරුවෙකු කලා වැවේ නිර්මාණය සදොස් යැයි ප්‍රකාශ කළේ ය. ඒ පිළිබඳ ප්‍රකාශයක් කළ ඉංග්‍රීසි මිනින්දෝරුවෙකු කියා සිටියේ එම ඉංජිනේරුවාගේ උපකරණවල සදොස් බවක් මිස යෝධ වැවේ සැලැස්ම නිදොස් බවයි. සිංහලයන්ගේ වාරිමාර්ග පිළිබඳ කීර්තිය දෙස් විදෙස්හි පවා පැතිර ගියේ ය. වංක නාසික තිස්ස රජු කළ කාවේරි පටුන අස්වැද්දීම සඳහා සිංහලයන් 12,000 ක් ඒ රටට ගෙන ගිය බව සඳහන් වන අතර, ජයවීර නම් කාශ්මීර රජු ක්‍රි. ව. 745 දී සිංහලයන්ගේ සහාය ලබාගත් බවට රාජතරංගනියේ සඳහන් වේ.

i. මෙම පාඨයෙන් විස්තර වන්නේ කුමන කරුණක් පිළිබඳව ද?
ii. අතීත සිංහලයාගේ තාක්ෂණික ඥානය විදහා දක්වන සාධකයන් වන්නේ මොනවා ද?
iii. සිංහලයන්ගේ ඉංජිනේරු ශිල්පීය ඥානය බෙහෙවින් දියුණුව පැවතී යැයි කියන්නේ ඇයි?
iv. සිංහලයන් තුළ පැවති තාක්ෂණික දියුණුව ඉතා ඉහළ මට්ටමක පැවතියේ කුමන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ද?
v. අප රටේ ඉංජිනේරුවන්ගේ විශේෂ දක්ෂතාවය පෙන්නුම් කරන සාධකයන් වන්නේ මොනවා ද?

(ලකුණු 2 x 5 = 10)

(05) කොළඹට ඉතා දුරින් පිහිටි "සපුමල්ගම" ග්‍රාමයේ පවුල් 200 ක් පමණ ජීවත් වේ. පොදුවේ මේ පවුල් වල ජීවත් වන බොහෝ දෙනෙක් ජාතික හැඳුනුම්පත ලබාගෙන නොමැත. විවිධ වූ සමාජීය කටයුතු වලදී මෙන්ම පෞද්ගලික අවශ්‍යතාවල දී අත්‍යවශ්‍ය වන ජාතික හැඳුනුම්පත තම ග්‍රාමයේ දී ම ලබා ගැනීම සඳහා ජංගම සේවාවක් පැවැත්වීමට අවශ්‍ය විධිවිධාන කටයුතු සලස්වා දෙන මෙන් ඉල්ලා සිටිමින් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස්තුමා වෙත යැවීමට ලිපියක් සකස් කරන්න. සපුමල්ගම ප්‍රගති ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් සඳුන් මුණසිංහ ඔබ යැයි සිතන්න. (මේ සඳහා වචන 100 ක් පමණ ප්‍රමාණවත්ය)

**නැතහොත්**

ඔබ විදුහලේ වාර්ෂික ශිෂ්‍ය නායක නිල ලාංඡන පැළඳවීමේ උත්සවය 2019.12.02 දින පැවැත්වීමට නියමිත යැයි උපකල්පනය කරමින් ශිෂ්‍ය නායක මණ්ඩලය මඟින් එම උත්සවය සඳහා සුදුසු න්‍යාය පත්‍රයක් සකස් කරන්න.

(ලකුණු 15)

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2019 | 21 S III |
|---|---|---|

**සිංහල භාෂාව හා සාහිත්‍යය - III පත්‍රය** — කාලය පැය දෙකයි

සැලකිය යුතුයි :-
- 1,2,3,4 ප්‍රශ්නවලටත් 5,6,7 යන ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයකටත් පමණක් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රය සඳහා නියමිත ලකුණු ගණන 80 කි.

- අංක i සිට x තෙක් ඇති සියලුම අනු කොටස් වලට කෙටි උත්තර ලියන්න. යම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(01) i. (අ) සතර කන් මන්ත්‍රණය පාඩමේ සඳහන් රජවරු දෙදෙනා නම් කරන්න.
(ආ) මහෞෂධ පඬිතුමාගේ බිසව කවුරුන් ද ?

ii. "ඕකත් වැඩක් යැ අනේ ! අරං යන්නකෝ ඉතින්"
(අ) ඉහත සඳහන් උද්ධෘතය අඩංගු මුල් කෘතියේ රචකයා නම් කරන්න.
(ආ) පාඨයේ සඳහන් පරිදි "අරං යන්න" යයි කීවේ කුමක් ද?

iii. "සුර ගඳඹුන් ලෙසට
පටන් ගෙන වෙණ ගායනාවට"
(අ) "ගඳඹුන්" යන්නෙහි තේරුම ලියන්න.
(ආ) මෙම පද්‍ය පාඨය රසවත් කිරීමට යොදා ගත් කාව්‍යාලංකාරය කුමක් ද?

iv. (අ) කෝට්ටේ යුගයේ ලියවුණු සංදේශ කාව්‍ය 02 ක් නම් කරන්න.
(ආ) "නිමල් සඳ පහන් වැනි වැලි පිට උඳුළ" යන පද්‍ය පාදය කිනම් සංදේශයකට අයත් ද?

v. (අ) " පිං ඇති සරසවි වරමක් දෙන්නේ" නමින් ස්වයං ලිඛිත චරිතාපදානයක් සම්පාදනය කෙරුණේ කා අතින් ද?
(ආ) එච්. එම්. කුඩලිගම මහතා ලියූ වෙනත් කාව්‍ය ග්‍රන්ථ 02 ක් නම් කරන්න.

vi. " මෙ තැන් පටන් ගෙනැ පව් නො කෙරෙමි; තොප ගෙ මියුරු කථා අසා යැ"
(අ) මෙසේ කීවේ කවුරුන් විසින් කා හට ද?
(ආ) මෙම ගද්‍ය පාඨය අයත් කෘතියේ කතුවරයා හා යුගය නම් කරන්න.

vii.(අ) " සිංහබාහු නාට්‍යය" කුමන සම්ප්‍රදායට අයත් නාට්‍යයක් ද?
(ආ) නොනිමි සිත්තම හා තවත් කෙටි කතා යන කෙටිකතා සංග්‍රහයෙන් උපුටා ගෙන ඇති ඔබට නිර්දිෂ්ට නිර්මාණය කුමක් ද?

viii.
කෙළෙහි ගුණ සින්දේ
මූසිල අන්ද මන්දේ
..............................................................
තමා වීණා තත ද සින්දේ

(අ) මෙම පද්‍යයේ තෙවන පේළිය සම්පූර්ණ කරන්න.
(ආ) මෙම පද්‍ය රචකයාගේ ගුරුවරයා ලෙස සැලකෙන්නේ කවුරුන් ද?

ix. " දිවි හිමියෙන් මා ඒ වේදනාවෙන් පෙළෙන බව දනිමි"
(අ) මෙහි "මා" යනුවෙන් අදහස් කරන්නේ කවුද?
(ආ) මෙහි සඳහන් "මා" යන අය පෙළෙන වේදනාව කුමක් ද?

x. " උඹ දැන් ඉක්මන් කරලා ගමට යන එකයි වඩා හොඳ"
(අ) මෙසේ ප්‍රකාශ කරන ලද්දේ කා හටද?
(ආ) මෙම පාඨය ඇතුළත් මුල් කෘතියේ නම කුමක් ද? (ලකුණු 2 x 10 20)

(02) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්න වලට කෙටි උත්තර ලියන්න.

i. නොගොසින් සිට සිටි වන නිබඳේ යා
වෙසෙසින් **සුර නර සෙන්** නොමඳේ යා
සතොසින් විඳ විඳ ලොබ නොසිඳේයා
මෙලෙසින් වෙණ නද අසන **සඳේයා**

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.
(ආ) කවියේ අදහස සරල බසින් ලියන්න.

ii. මේ පුංචි පැටවා මහා එකාටත් වඩා ලස්සන විය.
(අ) "පුංචි පැටවා" හා "මහා එකා" යනුවෙන් අදහස් කළේ මොනවාද?
(ආ) මෙම පාඨයෙන් කථකයාගේ කුමන හැඟීමක් නිරූපණය වේ ද?

iii. "බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එබස් අසා දණ්ඩෙන් ගසන ලද ආශිර්විෂයක්හු මෙන් ක්‍රෝධයෙන් දිලිහී කිපුණාහු"
(අ) මෙසේ බ්‍රහ්මදත්ත රජු කෝපයට පත් වුයේ ඇයි?
(ආ) මෙහි එන උපමාවෙහි උචිත බව පේළි දෙකකින් පැහැදිලි කරන්න.

iv. හෙ හැම **අරණ්‍යයෙහි හසර නැති කෙළෙ** දර පලා සඳහා **වල් යන්නාහු** නැති. රෑ ගමට වැද පයින් පැහැරැ දොර ගලවා - පියා එහි හොතුවන් මරා - පියා "එකෙකැ දෙකෙකැ'යි ගැණැගෙන - යෙයි. එකල් හි ගම් වැස්සො ගම් පියා ගොස් නියම්ගම් වන්නාහ.

(අ) තද කළු අකුරින් මුද්‍රිත වචන වල තේරුම ලියන්න.
(ආ) සමස්ත ගද්‍ය කොටසේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.

v. " ම දුව විකුණන්නා නැත" රන් හැර ගෙන නොදෙමි. අපටත් රක්ෂාව නම් **ඌ ම වේද?** නො ලදොත් මියෙන් නම් මිය ප්‍රයෝජන කිම් ද ? අප හා එක් වන්නාම දුව පාවා දෙමි'යි කිවුය. එසේ වී නම් මම උන් හා එක් වෙමි" කියා ලා **නෑයන් සියන්** නොඑක් ලෙසින් නැවතුවත් සිත් ගත් පරිදිම විද්දතුන් ළඟට ගියහ.

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල තේරුම ලියන්න.
(ආ) සමස්ත ගද්‍ය කොටසේ ම අර්ථය ලියන්න. ( ලකුණු 4 x 5 = 20 )

(03) උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව මගින්
i. කිසිදු ශිල්පයක් නූගත් තැනැත්තා සමාජයේ ගර්හාවට පත්වන අයුරුත්
ii. නිවැරදි ශිල්පයක් ඉගෙන ගෙන තිබීම හේතුවෙන් පුද්ගලයා සමාජ ගෞරවයට පාත්‍රවන ආකාරයත් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පහදන්න.

**නැතහොත්**

ගුත්තිල පඬිතුමාගේ සුමිහිරි වීණා වාදනයේ මිහිරියාවෙන්
i. සත්ත්ව සමූහයා ද
ii. මනුෂ්‍යයෝ ද
වසඟ වූ ආකාරය අපූරුවට නිරූපණය කිරීමට වැත්තෑවේ හිමියන් සමත් වී ඇත. ගුත්තිල වෙණ නද පාඩම ඇසුරින් එක් කරුණකට නිදසුන් දෙක බැගින් සපයමින් විස්තර කරන්න. (ලකුණු 15)

(04) i. මහෞෂධ පණ්ඩිතයන් වේදේහ රාජ්‍යය ආරක්ෂා කර ගත් ආකාරයත්
ii. කේවට්ට බමුණා හාස්‍යයට හා උපහාසයට ලක් වූ ආකාරයත්,
නිර්දිෂ්ට පාඩම ඇසුරින් එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

i. කුරක්කන් හේන සකස් කරන ගොවියා මුහුණ දෙන අභියෝග හා
ii. ඔහු ලබන සතුට ද
කුරක්කන් කවි මගින් මැනවින් පැහැදිලි කරයි. ඉහත එක් කරුණකට උදාහරණ 2 බැගින් සපයමින් විමසන්න. (ලකුණු 15)

★ **අංක 5, 6 හා 7 යන ප්‍රශ්නවල පිළිතුරක වචන 100 ක් පමණ තිබීම සෑහේ.**

(05) "අපට වැසිකිලියක්" කෙටි කතාවෙන් කියවෙන්නේ ගැමි ජනතාව තුළ යහපත් සෞඛ්‍ය පුරුදු ඇති කිරීමට නිලධාරීන් දැරූ උත්සාහයයි. " උදාහරණ තුනක්වත් දක්වමින් විමසන්න.

(06) උචිත භාෂා අලංකාර මගින් "බැද්දේගම" නවකතාව පාඨක සිත් ඇඳ බැඳ තබා ගැනීමට හේතු වූයේ කතුවරයා සතු දක්ෂතාවයයි. උදාහරණ තුනක් මගින් මෙම කියමන පැහැදිලි කරන්න.

(07) සැළලිහිණි සංදේශයේ එන ස්වභාව සෞන්දර්යය වර්ණනා ඉතා චමත්කාරජනක බව නිදසුන් තුනක් සහිතව ඇගයීමට ලක් කරන්න. (ලකුණු 10)

* * * *

# තෙවන වාර පරීක්ෂණය - 2019
## සිංහල භාෂාව හා සාහිත්‍යය

11 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | |
|---|---|---|---|
| 01 - 2 | 11 - 4 | 21 - 1 | 31 - 3 |
| 02 - 4 | 12 - 1 | 22 - 4 | 32 - 4 |
| 03 - 3 | 13 - 2 | 23 - 4 | 33 - 4 |
| 04 - 2 | 14 - 3 | 24 - 3 | 34 - 4 |
| 05 - 1 | 15 - 4 | 25 - 3 | 35 - 1 |
| 06 - 3 | 16 - 3 | 26 - 2 | 36 - 2 |
| 07 - 4 | 17 - 4 | 27 - 2 | 37 - 2 |
| 08 - 3 | 18 - 2 | 28 - 1 | 38 - 3 |
| 09 - 2 | 19 - 3 | 29 - 2 | 39 - 4 |
| 10 - 1 | 20 - 2 | 30 - 4 | 40 - 1 |

## II කොටස

(01) i. අ - තාලුජ - ච,ඡ, ජ, ඣ, ඤ ආ- දන්තජ - ත,ථ,ද,ධ, න

ii. අ - නටන්නා - කෘදන්ත ආ- සියපත - සමාස (අන්‍යාර්ථ)

iii. අ - ළිං පඬිය - ග්‍රාහ්‍යාක්ෂර ලෝප සන්ධිය ආ - දුප්පත් - පර රූප සන්ධිය

iv. අ - සුපේශල , ප්‍රභාවත්

v. අ - මිදුල ආ - සත්‍ය වචන

vi. අ - මන්දබුද්ධික ආ- විකාලභෝජන

vii. අ - සෙබළුන් විසින් ත්‍රස්තවාදීහු / ත්‍රස්තවාදියෝ වනසන ලදහ.
ආ - අප විසින් පහන් දැල්වෙයි.

viii. අ - ආයතන ප්‍රධානියා විසින් ඔවුහු කැඳවන ලදහ/ කැඳවනු ලැබූහ.
ආ- ඔහු විසින් මම රකිනු ලැබුවෙමි.

ix. අ - අවමංගල්‍ය උත්සවය / අවමඟුල් උළෙල ආ - වෙස්සන්තර චරිතය / වෙසතුරු සිරිත

x. අ - පිරිමි ළමයා ආ - අලි අල්ලන පුද්ගලයා

(02) මුළු ලකුණු 25
01. සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළුව ලකුණු 08
02. සංවිධානය, නිර්මාණාත්මක භාවය හා ස්වීයත්වය ලකුණු 12
03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම ලකුණු 05

(03) සාරාංශකරණය
මුළු ලකුණු ප්‍රමාණය 10 යි
01. අන්තර්ගතය ලකුණු 06
02. වචන ගණන ලකුණු 02
03. ශිල්පීය දක්ෂතා ලකුණු 02

(04) i. දේශීය තාක්ෂණය පිළිබඳව ය. / වාරි කර්මාන්ත හා ජල පද්ධති තාක්ෂණය පිළිබඳව ය.

ii. වැව් හා ඇළවල් ය.

iii. පිටරට වල පවා කීර්තිය පැතිරුණු නිසා ය.

iv. ඉඩම් මැනීම, ලකුණු කිරීම හා මට්ටම් කිරීම පිළිබඳව ය. (කරුණු 03 ම ඇත්නම් ලකුණු 2 යි. කරුණු 2 ක් පමණක් ඇත්නම් ලකුණු 01 යි. කරුණු 01 ක් පමණක් ඇත්නම් ලකුණු නැත).

v. ඇළහැර වේල්ල හා මිණිපේ වේල්ලත්, කලා වැවේ ජලය අනුරාධපුරයේ සිට ගෙන යෑම සඳහා ඉදිකර ඇති ජය ගඟ නම් ඇළයි. (කරුණු 03 ම ඇත්නම් ලකුණු 2 යි. කරුණු 2 ක් පමණක් ඇත්නම් ලකුණු 01 යි. කරුණු 01 ක් පමණක් ඇත්නම් ලකුණු නැත).

(05) ලකුණු 15 යි

# III කොටස

(01) i. (අ) චූලනී බ්‍රහ්මදත්ත රජු
වේදේහ රජු
(ආ) අමරා දේවිය

ii. (අ) ගී ද මෝපසාං (ආ) දියමන්ති මාලය

iii. (අ) ගදඹුන් - ගාන්ධර්වයා (ආ) උපමාලංකාරය

iv. (අ) හංස, කෝකිල, සැළලිහිණි, පරෙවි, ගිරා (ආ) සැළලිහිණි සංදේශයට

v. (අ) මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන් අතින්
(ආ) ඈ, කුණාටුව, එකෝමත් එක රටක, සංවාදය (ගංගාවේ සංගීතය හැර)

vi. (අ) අංගුලිමාල විසින් බුදුන් වහන්සේට
(ආ) ගුරුළුගෝමී පඬිවරයා - පොළොන්නරු යුගය

vii. (අ) ශෛලි ගත සම්ප්‍රදායේ නාට්‍යයකි.
(ආ) අපට වැසිකිළියක්

viii.(අ) ජයෙහි ලොබ බැන්දේ
(ආ) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

ix. (අ) සුප්පා දේවිය
(ආ) සිංහයා හැර දමා දරුවන් සමඟ යාමට සිදුවීම.

x. (අ) පුංචිමැණිකා
(ආ) Village in the jungle

(02) i. (අ) සුර නර සෙන් - දිව්‍ය මනුෂ්‍යය සේනාවන්
සඳේයා - වීණා නාදය අසන වෙලාවේ / කල්හි
(ආ) බොහෝ දිව්‍ය මනුෂ්‍ය සේනාවන් පිටතට නොගොස් සිටි තැන් වල ම සිට ගෙන නොසන්සිඳුණු ආශාවෙන් විශේෂ සතුටකින් රස විඳිමින් , වීණා නාදය අසන කල්හි

ii. (අ) පුංචි පැටවා - වැසිකිළිය
මහ එකා - නිවස
(ආ) කථකයා අධික සතුටට පත් වී ඇති බව

iii. (අ) මහෞෂධ පණ්ඩිතයන්ගේ යෝධයන් කේවට්ට පඬිතුමා විසින් සැලසුම් කළ ජය පානෝත්සවය කඩා කප්පල් කිරීම නිසා
(ආ) බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ට එම අවස්ථාවේ ඇති වූ කෝපය දණ්ඩයකින් පහර කෑ සර්පයෙකුගේ කෝපය හා සමාන බව දැක්වීම නිසා උපමාව හොඳින්ම ගැළපේ

iv. (අ) අරණ්‍යයෙහි හසර නැති - වනයෙහි වෙනත් මිනිසුන්ගේ ගැවසීම් / සංචාරයන් නැති විය.
වල් යන්නාහු - කැළෑවට යන අය
(ආ) අංගුලිමාල නිසා වනයෙහි වෙනත් මිනිසුන්ගේ සංචාරයන් නැති විය.දර හා පලා කොළ වර්ග සෙවීම සඳහා කිසිවෙක් වනයට නොගියේය. රෑ ගමට අංගුලිමාල පැමිණ නිවෙස් දොරවල් වලට පයින් ගසා ගොළ නිදා සිටින අය මරා එකක, දෙකක ආදි වශයෙන් ගණන් කරමින් යයි. එවිට ගම් වැසියෝ ගම් අත් හැර දමා නගරයට ආසන්න, බොහෝ ජනයා ජීවත් වන ප්‍රදේශවලට ගියහ.

iv. (අ) ඌ ම වේද ? - එයාම තමයි (විද්වත් දියණිය)
නෑයන් සියන් - නෑදැයන් හා ළඟින් ඇසුරු කරන හිතවතුන්
(ආ) විද්වත් දියණියගේ පියා මගේ දුව මුදලට විකුණන්නේ නෑ. අපගේ ආර්ථික රැකවරණයත් එයාම තමයි. මගේ දුව ලැබෙන්නේ නැත්නම් මැරුණාවයි. මැරිලා ඇති පලේ මොකක් ද? අපේ කණ්ඩායමට බැඳෙනවා නම් දුව පාවා දෙනවා යයි කීහ. එහෙම නම් මම විද්වත් දියණියගේ පවුලට එකතු වෙනවා යැයි කියා උග්ගසේන නෑදැයන්, හිතවතුන් කොතෙක් නැවැත්වීමට උත්සාහ කළත් ඔවුන් ළඟට ගියේ.

(03) හා (04) පිළිතුරු වලට ලකුණු 15 යි
(05) (06) (07) පිළිතුරු වලට ලකුණු 10 යි